**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ I කොටස (කඩවත-මීරිගම) - 2022**

**--------------------------------------------------------------------------------**

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ - I කොටසේ (කඩවත-මීරිගම) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,2019 මාර්තු 22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීනයේ ආනයන හා අපනයන බැංකුව අතර එළඹි අංක (2018) 17 එකතු අංක.(474) ණය ගිවිසුමේ 4 වගන්තියේ 4.6 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ කඩවත සිට මීරිගම දක්වා මධ්‍යම අධිවේගී මාර්ගයේ 1 වන කොටසේ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සහ අවසන් කිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 176,785 (සංශෝධිත) සහ ඉන් එ.ජ.ඩො. මිලියන 989.448 ට සමාන රු. මිලියන 134,628 ක් චීනයේ ආනයන හා අපනයන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ විය. ව්‍යාපෘතිය 2020 සැප්තැම්බර් 15 වන දින එහි කටයුතු ආරම්භ කර ඇති අතර 2024 සැප්තැම්බර් 14 වන දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහරිම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

  - අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

  - කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

  - හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 05 හි 26(a) වගන්තියට අනුව රු. මිලියන 61,534 ක් ව්‍යාපෘතිය විසින් වැඩ පූර්ව අත්තිකාරකම් ලෙස 2022 දෙසැම්බර් 31 දිනට හදුනාගත යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනයට අනුව එ.ජ.ඩො.මිලියන 169.45 ට සමාන රුපියල් මිලියන 23,001 මුදලක් විදේශීය සංරචකය යටතේ වැඩ පූර්ව අත්තිකාරකම් ලෙස දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සිවිල් වැඩ සඳහා අත්තිකාරම් ගෙවීම රු. මිලියන 29,263කින් අඩුවෙන් දක්වා තිබුණි. | 29,263 | අත්තිකාරම් ගෙවීමේදී ඉහළ ගිය විනිමය අනුපාතිකයේ බලපෑම මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘති -1 හඳුනාගෙන ඇති අතර ඒවා නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇත. කෙසේ වෙතත්, අපි මීළඟ මූල්‍ය ප්‍රකාශනවල අවසාන විනිමය අනුපාතිකය භාවිතා කරමින් වැඩ පූර්ව අත්තිකාරකම් සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නෙමු. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |
| (ආ) | මීට අමතරව පැකේජය 1 සහ 2 ට අදාළ සිවිල් වැඩ මත රඳවා ගැනීමේ මුදල් සඳහා වන විදේශ මුදල් ගනුදෙනුව ඉහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල වී නොතිබුණි. එබැවින් සිවිල් වැඩ මත රඳවා ගැනීමේ මුදල් වලට අදාළව විනිමය ලාභය/අලාභය මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. එබැවින් සිවිල් වැඩ මත මත රඳවා ගැනීමේ මුදල් අඩුවෙන් ගණනය වී තිබුණි. | 2,872 | පැකේජය 01 සහ 02 ට අදාළ සිවිල් වැඩ මත රඳවා ගැනීමේ මුදල් මීළඟ මූල්‍ය ප්‍රකාශනවල දෙසැම්බර් 31 වැනි දිනට විනිමය අනුපාතිකය භාවිතයෙන් සටහන් කෙරේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 05 හි 26(a) වගන්තියට අනුව 2022 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරය විසින් සිදු කරන ලද සමානාත්මතා ගැලපුම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන තුළ ගලපා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස චීනයේ ආනයන හා අපනයන බැංකුවේ ණය වටිනාකම අඩුවෙන් ගණනය වී තිබුණි. | 5,458 | අදාළ සමානාත්මතා ගැලපීම මීළඟ මූල්‍ය ප්‍රකාශනවලදී සිදු කෙරේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 04 හි 18 වගන්තියට අනුව මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘති -1 වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දරන ලද ණය පොලිය, ව්‍යාපෘතිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කෙරීගෙන යන වැඩ එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | 11,727 | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘති -1 ව්‍යාපෘතිය අවසන් වූ පසු එම වත්කම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පැවරෙනු ඇති අතර ඉන් පසුව මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘති -1 වෙනුවෙන් දරන ලද පොලී පිරිවැය මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම් පොත්වල ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |
| (ඉ) | සිවිල් වැඩ සහ උපදේශන සේවයේ විනිමය අලාභය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 04 හි 39 වගන්තියට අනුව වාර්තා කිරීම වෙනුවට 2022 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ හඳුනාගෙන තිබුණි. | 4,889 | ඉදිරි මූල්‍ය වර්ෂයේ සිට මුදල් හා මුදල් සමාන වෙනත් දෑ යටතේ විනිමය අලාභය පෙන්වනු ඇත | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |

**2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

| | නීති, රීති රෙගුලාසි ආදිය වෙත යොමු කිරීම | අනුකූල නොවීම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.3.2 වගන්තියට අනුව | ඵලදායී ව්‍යාපෘති කළමනාකරණය සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ සෑම විටම පූර්ණ කාලීන පදනමින් බඳවා ගත යුතුය. කෙසේ වෙතත්, වැඩබලන පදනම යටතේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා පත් කර තිබුණි. | 2022 වර්ෂයේදී නව බඳවාගැනීම් සීමා කර ඇති අතර වැඩබලන පදනම මත පළපුරුදු නිලධාරියෙකු යොදවා ඉතිරි කාර්යයන් සිදුකිරීමට තීරණය විය. | කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක 01/2019 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 ඡේදය අනුව | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්වන බවට රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා සහතික විය යුතු වුවද, සමලෝචිත වර්ෂයට අදාළව මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | මූල්‍ය අර්බුදය සහ රට තුළ පවතින ප්‍රවාහන ගැටලුව හේතුවෙන් ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට නියමිතව නොතිබුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය

| සංරචකය | 2022 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්ය සාධනය | 2022 දෙසැම්බර් 31 දිනට අත්පත් කරගත් කාර්ය සාධනය | විගණන නිරීක්ෂණ | ප්‍රමාද වීමට හේතු |
|---|---|---|---|---|
| | ඒකක /ප්‍රතිශතය | ඒකක /ප්‍රතිශතය | | |
| පැකේජ I | 96.96 | 39.16 | ව්‍යාපෘතිය විසින් එහි කටයුතු 2020 සැප්තැම්බර් 15 වන දින ආරම්භ කර 2024 සැප්තැම්බර් 14 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ත සැලසුම්ගත භෞතික ප්‍රගතිය සියයට 61 කි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වනතුරුත් ව්‍යාපෘතිය ලබාගෙන තිබුණේ සියයට 34ක ප්‍රගතියක් පමණි. කොන්ත්‍රාත්කරු නිසි වැඩ සැලැස්මක් අනුගමනය නොකර වැඩ ආරම්භ කර තිබීම සහ උපදේශකයින්ගේ දුර්වල අධීක්ෂණය ඉදිකිරීම්වල දුර්වල ප්‍රගතියට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | චීනයේ ආනයන හා අපනයන බැංකුව අතුරු ගෙවීම් සහතිකපත් සඳහා ගෙවීමට එකඟ වූ ණය ලබා දීම නතර කර ඇත. |
| පැකේජ II | 58.58 | 33.80 | | |

**කළමනාකරණ අදහස් දැක්වීම** "බාහිර සහ අභ්‍යන්තර ණය" ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡාවෙන් පසුව ණය සම්බන්ධ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තියෙන් අදහස් වන්නේ ණයට ගත් මුදල් සඳහා වගකීම හෝ භාණ්ඩයේ හෝ සේවාවක මිලදී ගැනීමේ මිල 2022.04.12 දින දක්වා කල්දැමීමයි. චීනයේ ආනයන හා අපනයන බැංකුව අතුරු ගෙවීම් සහතිකපත් සඳහා ගෙවීමට එකඟ වූ ණය ලබා දීම නතර කර ඇත.

**විගණකගේ නිර්දේශය** අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතියේ ප්‍රගතිය කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය

### 3.2 වැඩබිම් පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ දී පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ පළමු කොටස කඩවත සීඑච් 0+000 සිට සීඑච් 0+500 දක්වා ආරම්භක ස්ථානයේ සිදු කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 වන දින දක්වාත් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන කමිටුව සඳහා ටෙන්ඩර් ලේඛනය සකස් කර ඇත. අරමුදල් යාන්ත්‍රණය මේ මොහොතේ සකස්කර නොමැත. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් මුදල් ප්‍රතිපාදන ඉල්ලා ඇත. | සිවිල් වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මාර්ගයේ ඇතැම් ස්ථානවල ඉදිකිරීම් සඳහා හෑරූ වළවල් ජලයෙන් පිරී තිබූ අතර ඉදිකිරීම් බහුල වීම හේතුවෙන් කොන්ක්‍රීට් වැඩවල කම්බි අනාරක්ෂිත ලෙස නිරාවරණය වී තිබුණි. මෙම තත්ත්වය හේතුවෙන් එම ප්‍රදේශවල ප්‍රදේශවාසීන් අනතුරුදායක තත්ත්වයකට මුහුණ දී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් ගිවිසුමට අනුව මාර්ග ආරක්ෂාව සහ ව්‍යාපෘති ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි. | වැඩබිමේ මන්දගාමී ප්‍රගතියක් ක්‍රියාත්මක වුවද, ඉදිකිරීම් හේතුවෙන් සිදුවන මහජන අපහසුතාවයන් අවම කිරීමට කොන්ත්‍රාත්කරු ඉදිරිපත් වේ. | මහජන පහසුව සඳහා මාර්ග ආරක්‍ෂාව සහ ආරක්‍ෂිත සැලැස්මක් ඇති කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | බෝක්කු ඉදිකිරීම් දෙපස පස් පිරවීම සිදු කර නොතිබූ අතර බෝක්කු ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා දැමීම නිසා සාමාන්‍ය ජනතාවට දැඩි බලපෑමක් එල්ල වී තිබුණි. | ඉදිකිරීම් සිදුකෙරෙමින් පවතින ස්ථාන අවශ්‍ය ආරක්ෂිත පටි සහ පුවරු වලින් ආවරණය කිරීමට උපදෙස් දෙනු ලැබේ. | මහජන පහසුව සඳහා මාර්ග ආරක්ෂණ හා ආරක්ෂක සැලැස්මක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පැකේජ 01 ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 12,586 කට ප්‍රදානය කර තිබූ අතර ඉංජිනේරු ඇස්තමේන්තුව රු. මිලියන 9,834 කි. එම කොන්ත්‍රාත් මුදල ඉංජිනේරු ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 28 කින් ඉක්මවා තිබුණි. එසේම, පැකේජ 02 හි ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව රු. මිලියන 145,799 කට ලබා දී තිබූ අතර ඉංජිනේරු ඇස්තමේන්තුව රු. මිලියන 118,977 කි. එබැවින් ඉංජිනේරු ඇස්තමේන්තුවට සාපේක්ෂව කොන්ත්‍රාත් මුදල සියයට 23 කින් ඉක්මවා තිබුණි. කෙසේ වෙතත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 7.9.2 වගන්තියට අනුව අනුපාත විචලනයන් විශ්ලේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. මීට අමතරව එම කොන්ත්‍රාත්තු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.1 වගන්තියට අනුව තරඟකාරී ලංසු ක්‍රියාවලියක් අනුගමනය නොකර මිල කැඳවීම් නොලත් ව්‍යාපෘති ලෙස ප්‍රදානය කර තිබුණි. එපමණක් නොව, එම තත්ත්වය ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට අහිතකර ලෙස බලපා තිබුණි. | මෙම කොන්ත්‍රාත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.1 වගන්තියට අනුව තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් අනුගමනය නොකර කැබිනට් අනුමැතිය භාවිතා කරමින් මිල කැඳවීම් නොලත් ව්‍යාපෘති ලෙස ප්‍රදානය කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූල විය යුතුය. |
| (ආ) | ඉදිකිරීම් සඳහා වන පිඩික් කොන්දේසි හි උප වගන්තිය 4.2 අනුව කොන්ත්‍රාත්කරු ඔහුගේ වියදමින් කාර්ය සාධන ආරක්ෂාවක් ලබා ගත යුතු බව සඳහන් වී තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තු ලේඛනවල කොන්ත්‍රාත්කරුගේ වියදම් වන කාර්ය සාධන ආරක්‍ෂාව සැකසීම සඳහා ව්‍යාපෘතිය විසින් රු. මිලියන 805.43 ක් ගෙවා තිබීම කොන්ත්‍රාත්තු ලේඛනවල කොන්ත්‍රාත්කරුවන්ට හිතකර තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | කොන්ත්‍රාත්තු කොන්දේසි වලට අනුව කාර්ය සාධන ආරක්ෂාව කොන්ත්‍රාත්කරුගේ වියදමින් ලබා ගත යුතු වුවද, මිල ප්‍රමාණ පත්‍රවල කොන්ත්‍රාත්කරු විසින් ලංසු තැබීමට වෙනම ප්‍රතිපාදනයක් සපයා ඇත. | පිඩික් කොන්දේසියට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දේශීය සංරචකය යටතේ රු. මිලියන 755 ක් සහ විදේශීය සංරචකය යටතේ එ.ජ.ඩො.මිලියන 7 ක් පැකේජය 01 වෙත ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 වන දින දක්වා ව්‍යාපෘතිය විසින් වැඩ පූර්ව අත්තිකාරකම් නැවත අය කර ගෙන නොතිබුණි. තවද, පැකේජය 02 වෙත වැඩ පූර්ව අත්තිකාරකම් ලෙස එ.ජ.ඩො.මිලියන 161 ක් ගෙවා ඇති අතර කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 වන විට ඉන් අයකරගෙන ඇත්තේ එ.ජ.ඩො.මිලියන 10 ක් පමණි. | පිළිගත් කොන්ත්‍රාත් මුදලින් ඊළඟ අතුරු ගෙවීම්වල එකතුව සියයට 30 දක්වා ළඟා වූ පසු අත්තිකාරම් ගෙවීම් අඩු කිරීම් ආරම්භ වේ. | ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අංක 18 අතුරු ගෙවීම් සහතික පත්‍රයේ මිල ප්‍රමාණ පත්‍ර අයිතම 1001 (7) අනුව තාවකාලික මාර්ග හෝ නියමු මාර්ග ඉදිකිරීම සඳහා රු. මිලියන 750 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, විචලන කමිටුවේ අනුමැතියකින් තොරව රු. මිලියන 981ක් ගෙවීමට නිර්දේශ කර තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් කිසිදු විචලන නියෝගයක් ඉදිරිපත් කර නොතිබුණි. විචලන කමිටුවේ අනුමැතියකින් තොරව නියමු මාර්ග නඩත්තුව සඳහා මිල ප්‍රමාණ පත්‍ර අයිතම 107(1) යටතේ රු. මිලියන 22.7ක් ගෙවීමට නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත්, නියමු මාර්ගයේ සීඑච් 25+400 සිට සීඑච් 29+300 දක්වා කොටස 2022 දෙසැම්බර් 31 දක්වා නිම කර නොතිබුණි. | මිල ප්‍රමාණ පත්රය නිසා විචලන කමිටුවේ අනුමැතිය අවශ්‍ය නොවීම සහ එය මාසික පදනමක් ලෙස ගෙවනු ලබන්නේ ඉංජිනේරුවරයාගේ පිළිගතහැකි ප්‍රමාණයට පමණි. | විචලන කමිටුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඉ) | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් රු. මිලියන 1,016 ක පොලී වියදම් හඳුනාගෙන ඇති අතර එය ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට සෘජුවම බලපා තිබුණි. | මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ප්‍රමාණවත් මුදල් නොලැබීමයි. | අමතර වියදමකින් තොරව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඊ) | ප්‍රධාන කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් මිල ප්‍රමාණ පත්‍ර අයිතම 102(1) සඳහා රු. මිලියන 64ක මුදලක් එකවර පැවරීමට 2017 නොවැම්බර් 23 දින පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී තීරණය කර තිබුණද නිසි අනුමැතියක් ලබා නොදී එය මිල ප්‍රමාණ පත්‍ර අයිතම 10.35 වෙත මාරු කර තිබුණි. | 2017 නොවැම්බර් 23 දින පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී කොන්ත්‍රාත්කරු සහ සේවායෝජකයා විසින් එකවර මුදල් ගෙවීම වෙන්කළ ප්‍රතිපාදන සඳහා ගෙවීමක් ලෙස මාරු කිරීමට එකඟ විය. | මිල ප්‍රමාණ පත්‍රයහි පිරිවැය අයිතම මාරු කිරීමේ සඳහා නිසි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4 ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ නිරීක්ෂණ**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට 38(අ) ගැසට් නිවේදනය යටතේ ඉඩම් කැබලි 5,154ක් දැනටමත් අත්පත් කරගෙන තිබුණද, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තියට අනුව ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වසර අවසානය වනවිට ලියාපදිංචි කර තිබුණේ ඉඩම් කැබලි 877ක් පමණි. | ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | පැකේජය 1 සහ 2 හි සම්පූර්ණ මාර්ග කොටස සඳහා භූමිය සන්තකයේ තබා ගැනීම පිළිවෙළින් 2021 මාර්තු 15 සහ 2022 මාර්තු 15 යන දිනවලදී කොන්ත්‍රාත්කරුට භාර දිය යුතුය. කෙසේ වෙතත්, ඉඩම් කැබලි 6.211 ක අයිතිය කොන්ත්‍රාත්කරුට නියමිත වේලාවට පවරා නොතිබුණි. එබැවින් ව්‍යාපෘතිය නියමිත වේලාවට අවසන් කිරීමට එය අහිතකර ලෙස බලපා ඇති අතර එමඟින් ව්‍යාපෘතියේ පිරිවැය වැඩි වී තිබුණි. | නියමිත වේලාවට ඉඩම් අත්පත් කර ගැනීම් අග්‍රිමය නොලැබුණු අතර කොවිඩ්-19 ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාද වීමට බලපෑවේය. | එම ස්ථානය නියමිත වේලාවට පවරා දීමට වහා පියවර ගත යුතුය. |